පොඩිත්තන්ට ජනකතා - 1

# දුරා’තීතයේ චීන ජනකතා

Selected stories from


# Chinese Fables and Folk Stories

UNEDITED SAMPLE PAGE

# කතාන්දර පෙළගැස්ම


| | කතාව | පිටුව |
|---|---|---|
| 1. | සත්ව ගොවිපොළේ සාම සාදය | 15 |
| 2. | වනස්පති ගස් සහ දහස්පෙති මල් | 23 |
| 3. | අහංකාර කුකුළ් රජා | 31 |
| 4. | දෙහි ගස සහ ජම්බෝල ගස | 39 |
| 5. | කොමඩු, දිවුල් සහ මහාචාර්යවරයා | 45 |
| 6. | කාරුණික කුරුල්ලන්ගෙන් දඩයක්කාරයාට පාඩමක් | 49 |
| 7. | සුළඟ, වලාකුළු සහ හිම | 55 |
| 8. | මල් සහ මාළු | 67 |
| 9. | කිකිළිය, බළලා සහ කුරුල්ලා | 72 |
| 10. | බැරි දේවල්ම කරන්න ගිය පුංචි පිරිමි ළමයා | 80 |
| 11. | උදරය අතරමං කළ ශරීරය | 90 |
| 12. | ආඩම්බර නරියා සහ කකුළුවා | 96 |
| 13. | පුංචි චීන රෝසමල | 101 |
| 14. | රාජාලි අම්මා සහ වී කුරුල්ලෝ | 105 |
| 15. | බල්ලා සහ පිරිමි ළමයි | 118 |
| 16. | පිරිමි පාසලකට ගිය බාලිකාවන් තුන්දෙනා | 124 |
| 17. | වේවැල් වැල සහ රෝස ගස | 134 |


UNEDITED SAMPLE PAGE



UNEDITED SAMPLE PAGE

01

## සත්ව ගොවිපොළේ සාම සාදය

ඌරා ඉතා අපිරිසිදු සතෙකු බවත්, ඔවුන්ගෙන් ලෝකයට හෝ මිනිසාට ප්‍රයෝජනයක් නැති බවත් පැරණි පොත්වල සඳහන් වෙනවා. එයින් එකක මේ කතාව අඩංගු වෙනවා:

ඔන්න, ඉස්සර කාලෙ එක සත්ව ගොවිපොළක් තිබුණා. එහි සිටි අශ්වයන් සහ ගවයන් වරෙක අවුරුද්ද අන්තිමට සාදයක් පවත්වන්නට සූදානම් වුණා. ඌරන් හරිම කැදර සතුන් විදියටයි ඔවුන් අතර පිළිගැනීම තිබුණේ. ඒ නිසා එයාලට සාදයට ආරාධනා කරනවාට ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් කැමති වුණේ නෑ.

ඒත්, එතන හිටිය වැඩිහිටි අශ්වයෙක් හොඳට කල්පනා කරලා මෙන්න මේ විදියට යෝජනාවක් කළා.

UNEDITED SAMPLE PAGE

"අපි ඔවුන්ටත් ආරාධනා කරමු, සමහර විට අපට මේ ආකාරයෙන් අපේ රණ්ඩු දබර නතර කරලා හොඳ යාළුවො වෙන්නත් පුළුවන් වේවි. ඉතින්... අපි මේක සාම සාදයක් විදියට හඳුන්වමු."

"පරම්පරාවෙන් පරම්පරාවට ඌරො අපේ වැටවල් කැඩුවා, අපේ ආහාර හොරා කෑවා, අපේ වතුර ටික බිව්වා, ඒ විතරක්ද, කොළ පාටින් බැබළෙන අපේ තණ කොළ පිට්ටනිය මුලින්ම ගලවලා දැම්මා... ඒත් ඉතින්..., අපේ වහු පැටව් පුංචි ඌරු පැටවුන්ට හුඟක් රිදවලා තියෙන බවත් ඇත්ත." එක් වැඩිහිටි ගවයෙක් කිව්වා.

"මේ සේරම කරදරකාර වැඩ සහ සටන් කියන්නේ වැරදි දේවල්. අපි එකිනෙකා සමඟ සාමයෙන් ජීවත් වෙනවා දකින්නට දෙවියන් පවා කැමති බව අපි දන්නවා. සාම සාදයක් කියන්නේ මේ කරදර නිරාකරණය කර ගැනීමට හොඳ සැලැස්මක් කියලා ඔබලාට සිතෙන්නේ නැද්ද?"

"අපේ මේ සාදය මෙහෙයවන නායකයා කවුද? අනික් අයට ආරාධනා කරන්නේ කවුද? ඌරන්ගේ ගෙවල්වලට ගිහින් ඔවුන්ට ආරාධනා කරන්නට අපට ආචාර සම්පන්න සහ කාරුණික කෙනෙක් හිටියොත් හොඳයි නේද?" කරුණාවන්ත වැඩිහිටි එළදෙනක් ඒ විදියට අදහස් පළ කළා. හැමෝගෙම කැමැත්ත ඇතිව ඊළඟ දවසේ ඌරන්ට ආරාධනා කරන්නට ඉතා කරුණාවන්ත පියකරු පුංචි වැස්සියක් යැව්වා.

UNEDITED SAMPLE PAGE

ඇය ඌරන්ගේ මිදුලට යන විටම, සියලුම තරුණ ඌරන් පැන පැන ඇවිත්, "ඔබ මොකද අපේ ගෙවල් පැත්තෙ එන්නේ? ඔබටත් සටන් කරන්න වුවමනා වෙලාද?" කියලා සුපුරුදු හඬින් ගොරවමින් ඇහුවා.

"අනේ නැහැ, මට රණ්ඩු වෙන්න ඕනි නැහැ," වැස්සිය බොහොම මිත්‍රශීලී විදියට කිව්වා.

"අපේ පැත්තේ ඉන්න අශ්වයොයි, ගවයොයි එකතු වෙලා සාම සාදයක් පවත්වන්න සූදානම් වෙනවා. මාව මෙතැනට එව්වේ අපේ ඒ සාදයට සහභාගී වෙන්න කියලා ඔයාලා හැමෝටම ආරාධනා කරන්නයි. ඔයාලා හැමදෙනාම එනවාද කියලා දැන ගන්නත් මං කැමතියි, එහෙම නම් මට ඒ බව අපේ නායකයාට දැනුම් දෙන්න පුළුවන්."

"අපි පණිවිඩකරුවෙක් එවන්නම්." එයාලලෙ නායක ඌරා ටිකක් ආඩම්බරෙන් වගේ කිව්වට පස්සෙ අර තරුණ වැස්සිය ඔහුට ස්තුති කරලා ආපහු ගියා.

තරුණ, වැඩිහිටි සහ මහලු ඌරො හැමෝම එකතු වෙලා මේ ගැන සාකච්ඡා කළා.

"අලුත් අවුරුදු උත්සවයත් ළඟදීම එනවා. ඉතින් ඒ ගොල්ලො අපට සාදයේ දී කෑමට හොඳ දේවල් ලබා දේවි. අපි යන එක හොඳයි කියලයි මං හිතන්නෙ." ඌරු කණ්ඩායමේ හිටිය වයස්ගත ඌරෙක් කිව්වා.

UNEDITED SAMPLE PAGE

අවසානයේ ඌරු පවුලේ සියලු දෙනාම අතරින් ලස්සනට කතා කරන්න පුළුවන් තරුණයා තෝරාගෙන සාදයට පැමිණෙන බවට ඔහු අතේ අශ්ව නායකයාට පණිවිඩයක් යැව්වා.

සාදයට නියමිත දවස උදා වුණා. ඌරු පවුලේ හැමෝම සාදයට සහභාගී වෙන්නට ගවයින් සහ අශ්වයින් පදිංචි කොටසට ගියා. ඔවුන්ගේ කණ්ඩායමේ ඌරන් තුන්සියයක් පමණ සිටියා. එහි ළඟාවන විටම ඔවුන් දුටුවා ගව රැලේ සිටි සියලුම ගවයින් අතරින් වඩාත්ම ලස්සන තරුණ ගවදෙනක් ඉතා කරුණාවෙන් සහ ආදරයෙන් අමුත්තන් පිළිගන්නා බව.

ටික වේලාවකට පස්සෙ අශ්වයින්ගේ නායකයා ඉතාම මෘදු හඬින් ඔවුන්ට කතා කළා.

ඌරු පවුලේ සිටි වඩාත්ම වැඩිහිටි ඌරා ඇමතූ ඔහු, “අපේ මේ තණ බිමේ තවදුරටත් ආරවුල් ඇති නොවෙනවා නම්, එය අපි කාටත් සතුටට කාරණාවක් නේද? අපේ වැටවල් කඩන්න එපා කියලාත්, බිම විනාශ කරමින් අපේ ආහාර පාන හොරකම් කරන්න එපා කියලාත් කරුණාකරලා ඔබේ කණ්ඩායමට කියන්න. මින් පස්සේ අපේ ගවයින් සහ අශ්වයින් ඔබේ දරුවන්ට රිදවන්නේ නැති බවටත්, පැරණි කරදර සියල්ල අද සිට අමතක කරන බවටත් අපි පොරොන්දු වෙනවා.”

UNEDITED SAMPLE PAGE

මේ වෙලාවෙ එක් තරුණ ඌරෙක් නැගිටලා ටිකක් ආවේගශීලී ව කතා කරන්න පටන් ගත්තා. "මේ විශාල තණබිම් සේරම අයිති වෙන්නේ අපේ ස්වාමියාට මිස ඔබලාට නොවේ..." ඌරා තරමක් වේගවත් හඬකින් කිව්වා.

"අපට ආහාර පාන සොයමින් වෙනත් තැන්වලට යන්න බැහැ. අප පෝෂණය කරන්නට අපේ ස්වාමියා සේවකයෙක් යොදවලා තියෙනනවා. එයා තමයි සමහරදාට ඉරිඟු සහ අර්තාපල් කන්න අප ඔබේ මිදුලට එවන්නේ. ස්වාමියාගේ සේවකයෝ හැමදාම අපේ කොටු පිරිසිදු කරනවා. ගිම්හාන කාලයට අපට නාලා සෙල්ලම් කරන්න නාන කොටුවලට වතුර පුරවනවා. ඉතින් යාළුවනේ, මේ තණ පිට්ටනි සහ මේ ආහාර සියල්ලම අයිති අපේ හාම්පුතාට බව ඔබත් පිළිගන්නවා නේද? අපි කැම කාලා කැමති තැනකට යනවා. අපි ඔබලාගේ ආහාර ප්‍රයෝජනයට ගන්නේ ඔබලා පාවිච්චි කරලා ඉවර වුණාම විතරයි. අපි එහෙම කරන්නේ නැත්නම් මේ පොළොවත් අපිරිසිදු වේවි. මට මේ ප්‍රශ්නයට උත්තර දෙන්න... අපේ උදවිය කවදාවත් ඔබලාගේ නෑදෑයින්ට රිදෙන දෙයක් කරනවාද? නැහැ. ඒත්, හැම අවුරුද්දකම නපුරු ගවයන් හා අශ්වයින් අපේ පවුලේ පුංචි දරුවන්ව මරා දමනවා. ඔබේ ආහාර මොනවාද කියන එක අපට වැදගත් නෑ. නමුත් අපේ ජීවිත අපට වටිනවා. අපේ ස්වාමියා කවදාවත් අශ්වයන් සහ ගොනුන් වගේ අපේ

UNEDITED SAMPLE PAGE

අය බර වැඩට යවන්නේ නැහැ. ඔහු අපට ආහාර ලබා දෙනවා, අවුරුද්දෙන් අවුරුද්ද එකම විදියට සෙල්ලම් කරන්න ඉඩ දෙනවා. ඒ ඇයි? ඔහු අපට වඩාත් කැමති නිසා...” තරුණ ඌරාට සහයෝගය දෙන්න තවත් ඒ වගේම හැඩිදැඩි ඌරෙක් කතා කරන්න පටන් ගත්තා.

“ඔබලාගේ පැත්තේ සිටින අශ්වයින් සහ ගවයින් නිතරම බර වැඩ කරන බව හැමෝටම පෙනෙනවානේ. සමහරු කරත්ත ඇදගෙන යනවා, තවත් සමහරු කුඹුරු හානවා... අසනීපෙන් ඉන්න වෙලාවට වුණත් ඒ ගොල්ලො වැඩ කරන්න ඕනි. ඒත්, අපේ පවුල්වල අය කවදාවත් එහෙම වැඩ කරන්නේ නැහැ, හැමදාම අපි සෙල්ලම් කරමින් සන්තෝස වෙනවා. ඒ වෙලාවට; අපි කොච්චර පුෂ්ටිමත්ද කියලා ඔයාලට පේනවා නේද? කිසිම වෙලාවක ඔයාලා අපේ ඇටකටු දැකලා තියෙනවාද? ඒත් මහලු අශ්වයන් සහ ගවයින් දෙස බලන්න. අවුරුදු විස්සක් වැඩකළත් කිසිම විවේකයක් නැහැ! මා ඔබට කියන්නේ, අපේ ස්වාමියා ඌරන්ට තරම් අශ්වයන්ට සහ ගවයන්ට ගෞරව කරන්නේ නැති බවයි.”

මේ විදියට මහ දිග කතාවක් කළ ඔහු අවසානයේ මෙසේ කියමින් කතාව අවසන් කළා. “මිත්‍රවරුනි, මට කියන්නට ඇත්තේ එපමණයි. ඔබට අසන්නට ප්‍රශ්න කිසිවක් තිබෙනවාද? මා කියූ දේවල් බොරුද?” මහලු එළදෙන, “මූ, මූ” කියමින් කනගාටුවෙන් හිස සැලුවා.

UNEDITED SAMPLE PAGE

දිග කතාවක් අහලා වෙහෙසට පත් වුණු අශ්වයින් "හුහ්, හුහ්..." යනුවෙන් හති හලමින් සිටියා මිස එකම වචනයක්වත් කථා කළේ නැහැ.

"මාගේ මිත්‍රවරුනි, අපට දැනගන්නට අමාරු දේවල් ගැන කරදර නොවී සිටීමයි හොඳ. අපේ ස්වාමියා ගැන අපට නොතේරෙන බවයි මට පෙනෙන්නේ..." ගව නායකයා පැවසුවා.

"අලුත් අවුරුදු මංගල්ලයට ඉක්මනින් කාලය පැමිණේවි; අපේ සාම සාදය සාර්ථක නොවුණත්, අශ්වයින් සහ ගවයින් මෙන්ම ඌරු පවුලේ අයත් දිගු කාලයක් සතුටින් ජීවත් වේවා! ඉතින්, හැමෝටම සුබ රාත්‍රියක්!"

අශ්ව නායකයා සාදයට පැමිණි සියලු දෙනාටම සමු දෙමින් පැවසුවා.

ආපසු තමන්ගේ ගෙදර යන ගමනේදී කුඩා ඌරු පැටව් විශාල ලෙස ශබ්දයක් නගමින් ගියා.

"අපි, අපි! අපි දිනුවා, අපි දිනුවා!" සැම කෙනෙක්ම පැවසුවේ එහෙමයි.

ඊට පස්සෙ වැඩිහිටි අශ්වයන් සහ ගවයින් එකිනෙකා සාකච්ඡා කළා.

"අපි ඌරන්ට වඩා ශක්තිමත්, ඥානවන්ත හා ප්‍රයෝජනවත්." යැයි ඔවුන් කතා වුණා.

UNEDITED SAMPLE PAGE

"ඇයි අපේ ස්වාමියා අපට මෙහෙම සලකන්නේ?"

*සමහර දේට අනෙක් ඒවාට වඩා වැඩි බලයක් ඇත්තේ ඇයි? දන්නේ එක් අයෙක් පමණි. සමහර අයට අනෙක් අයට වඩා දිගු ආයු කාලයක් තිබෙන්නේ ඇයි? දන්නේ එක් අයෙක් පමණි. සමහරු උත්සාහ කරන තරමට සාර්ථක නොවන්නේ ඇයි; අනෙක් අය උත්සාහ නොකළත් ඔවුන් සාර්ථක වෙනවාද? දන්නේ එක් අයෙක් පමණි.*

ආදර්ශය:

**මැවුම්කරු විසින් ලෝකය සෑම දෙයකටම ගැළපෙන සේ නිර්මාණය කර ඇති අතර, එයට අනුව ජීවත් වන අතරම, ශක්තිවන්තයා දුබලයා යටත් කිරීමට උත්සාහ නොකළ යුතු ය.**

UNEDITED SAMPLE PAGE